ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2455/08 - 2025 සැප්තැම්බර් මස 22 වැනි සඳුදා - 2025.09.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය හරිනි අමරසූරිය වන මා විසින්, 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති සමාගමක් වන, ලියාපදිංචි අංක PV 94125 දරන, මානෙල්වත්ත, බොල්ලෑගල, කැලණිය යන ස්ථානයේ පිහිටි, උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස පිළිගනු ලබන නාගානන්ද ඉන්ටර්නැෂනල් ඉන්ස්ටිටියුට් ෆො බුඩිස්ට් ස්ටඩීස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන් එකී පනතේ 70 ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසු, මෙම නියමය මගින්, එකී පනත යටතේ සාදනු ලැබූ 2015 දෙසැම්බර් මස 07 වැනි දින අංක 1944/2 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ ඇතුළත් උපලේඛනය වෙනුවට පහත I වන උපලේඛනය හා II වන උපලේඛනය ආදේශ කිරීමෙන් එකී නියමය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**1 වන උපලේඛනය**

***කොන්දේසි***

(1) නාගානන්ද ඉන්ටර්නැෂනල් ඉන්ස්ටිටියුට් ෆො බුඩිස්ට් ස්ටඩීස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින්, මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධි පාඨමාලා හැදෑරීම සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ දී,

(අ) අවම අධ්‍යයන සම්භාර 90ක් සහිත (එස්. එල්. කිව්. එෆ්. 5 වන මට්ටමෙහි) බෞද්ධ අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී කවර හෝ විෂය ධාරාවකින් අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ (එස්) තුනක් (3) එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම යන අවම ඇතුළත් කරගැනීමේ සුදුසුකම්වලට අනුකූලව කටයුතු කළ යුතුය.

(ආ) අවම අධ්‍යයන සම්භාර 120ක් සහිත (එස්. එල්. කිව්. එෆ්. 6 වන මට්ටමෙහි) බෞද්ධ අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධිය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී බුද්ධාගම/ බෞද්ධ ශිෂ්ඨාචාරය/ පාලි/ සංස්කෘත යන විෂයයන්ගෙන් එක් විෂයක් සමග කවර හෝ විෂයයන් තුනක් සඳහා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ (එස්) තුනක් (3) එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම යන අවම ඇතුළත් කරගැනීමේ සුදුසුකම්වලට අනුකූලව කටයුතු කළ යුතුය.

1A - PG 7258 - 284 (2025/09)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(ඇ) අවම අධ්‍යයන සම්භාර 25ක් සහිත (එස්. එල්. කිව්. එෆ්. 8 වන මට්ටමෙහි) බෞද්ධ අධ්‍යයනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සම්බන්ධයෙන්,

(1) (I) බෞද්ධ අධ්‍යයන සම්බන්ධ විෂය ක්ෂේත්‍රයකින් අධ්‍යයන සම්භාර 30ක් ඇතුළත්; හෝ

(II) අදාළ විෂය ක්ෂේත්‍රයේ අධ්‍යයන සම්භාර 30කට සමාන වන පූර්ව ඉගැනුම්/සේවා අත්දැකීම් හෝ සහිත පිළිගත් ප්‍රථම උපාධියක් ලබා තිබීම; හෝ

(2) 1 (i) ට හෝ (ii) ට සමාන අදාළ විෂය ක්ෂේත්‍රයේ යෝග්‍යතාවයක් සහිත වීම යන අවම ඇතුළත් කරගැනීමේ සුදුසුකම්වලට අනුකූලව කටයුතු කළ යුතුය.

(ඇ) අවම අධ්‍යයන සම්භාර 30 ක් සහිත (එස්. එල්. කිව්. එෆ්. 09 වන මට්ටමෙහි) බෞද්ධ අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සම්බන්ධයෙන්,

(1) (I) බෞද්ධ අධ්‍යයන සම්බන්ධ විෂය ක්ෂේත්‍රයකින් අධ්‍යයන සම්භාර 30ක් ඇතුළත්; හෝ

(II) අදාළ විෂය ක්ෂේත්‍රයේ අධ්‍යයන සම්භාර 30කට සමාන වන පූර්ව ඉගැනුම්/සේවා අත්දැකීම් හෝ සහිත පිළිගත් ප්‍රථම උපාධියක් ලබා තිබීම; හෝ

(2) 1 (i) ට හෝ (ii) ට සමාන අදාළ විෂය ක්ෂේත්‍රයේ යෝග්‍යතාවයක් සහිත වීම; හෝ

(3) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන විෂය භාර අමාත්‍යාංශය විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින්/ ආයතනයකින් පිරිනමන කවර හෝ විෂය ක්ෂේත්‍රයක ප්‍රථම උපාධිය ලබාතිබීම සහ උසස් අධ්‍යාපන ආයතනයේ අධ්‍යයන අධිකාරිය විසින් පිළිගත් යෝග්‍යතා පරීක්ෂණයකින් සමත්වීම තිබීම; හෝ

(4) මියන්මාරයේ ධර්මාචාරය සුදුසුකම් ලබා තිබීම; හෝ

(5) ශ්‍රී ලංකාවේ ප්‍රාචීන අධ්‍යයන සංගමයේ අවසාන විභාගය සමත් වීම යන අවම සුදුසුකම්වලට අනුකූලව කටයුතු කළ යුතුය.

(ඉ) බෞද්ධ අධ්‍යයනය පිළිබඳ දර්ශනපති උපාධිය (එස්. එල්. කිව්. එෆ්. 11 වන මට්ටමෙහි) සම්බන්ධයෙන්,

(1) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන විෂය භාර අමාත්‍යාංශය විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින්/ ආයතනයකින් පිරිනමන බෞද්ධ අධ්‍යයන විෂය යටතේ, අවම වශයෙන් අධ්‍යයන සම්භාර 30ක් සමග එස්. එල්. කිව්. එෆ්. 06 වැනි මට්ටමෙහි ප්‍රථම ගෞරව උපාධියක් සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබීම; හෝ

(2) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන විෂය භාර අමාත්‍යාංශය විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින්/ ආයතනයකින් සම්බන්ධිත විෂය ක්ෂේත්‍රයක් යටතේ අවම වශයෙන් අධ්‍යයන සම්භාර 30ක් සමග එස්. එල්. කිව්. එෆ්. 06 වැනි මට්ටමෙහි ප්‍රථම ගෞරව උපාධියක් සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබීම සහ යෝග්‍යතා පරීක්ෂණයකින් සාර්ථක ලෙස සම්පූර්ණ කරතිබීම; හෝ

(3) 0-4 පරිමාණයෙන් අවම ශ්‍රේණි ලකුණු සාමාන්‍ය 3.00 හෝ ඉහළ ප්‍රමාණයක් සමග පස් වැනි ස්ථරයේ ප්‍රථම උපාධියක් හා ඒ විෂය ක්ෂේත්‍රයේ හෝ අදාළ විෂය ක්ෂේත්‍රයක එස්. එල්. කිව්. එෆ්. 07 වැනි මට්ටමට සමාන වන අධ්‍යයන සම්භාර 30ක් සම්පූර්ණ කිරීමෙන් පසුව පැවැත්වෙන පරීක්ෂණයක් සමත් වීම; හෝ

(4) අදාළ විෂය ක්ෂේත්‍රයේ එස්. එල්. කිව්. එෆ්. 07 හෝ ඉහළ ස්ථරයක යෝග්‍යතාවයක් සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබීම යන අවම සුදුසුකම්වලට අනුකූලව කටයුතු කළ යුතුය.

(2) ඉහත (1) යටතේ අදාළ වන අවම ප්‍රවේශ සුදුසුකම් 2023.06.05 දිනැති (සංශෝධිත පරිදි) අදාළ රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන චක්‍රලේඛ අංක 02/2023 හි සඳහන් පරිදි 2023.07.01 දින සිට බලාත්මක විය යුතුය.

(3) ඉහත චක්‍රලේඛය බලාත්මක වීමට පෙර ඇතුළත් කර ගන්නා යම් සිසුවකු, ඔහු ඇතුළත් කරගන්නා අවස්ථාවේදී අදාළ වූ අවම ඇතුළත් කරගැනීමේ සුදුසුකම් මත පදනම්ව එකී උපාධිය අඛණ්ඩව කරගෙන යා යුතුය.

(4) නිශ්චිත බලධාරයා විසින් පවත්වනු ලබන පස් අවුරුදු (5) සමාලෝචනයකට යටත්ව, මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන උපාධි පිරිනැමීම සඳහා නාගානන්ද ඉන්ටර් නැෂනල් ඉන්ස්ටිටියුට් ෆො බුඩිස්ට් ස්ටඩීස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය පිළිගනු ලැබිය යුතුය.

**II වන උපලේඛනය**

| *I වන තීරය*<br>*උපාධිය* | *II වන තීරය*<br>*උපාධිය සඳහා වන කෙටි යෙදුම* |
|---|---|
| බෞද්ධ අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය | බී ඒ (බෞද්ධ අධ්‍යයනය) |
| බෞද්ධ අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධිය | බී ඒ (විශේෂ) (බෞද්ධ අධ්‍යයනය) |
| බෞද්ධ අධ්‍යයනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | පී ජී ඩිප් (බෞද්ධ අධ්‍යයනය) |
| බෞද්ධ අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය | එම්. ඒ. (බෞද්ධ අධ්‍යයනය) |
| බෞද්ධ අධ්‍යයනය පිළිබඳ දර්ශනපති උපාධිය | එම්. ෆිල්. (බෞද්ධ අධ්‍යයනය) |

ආචාර්ය **හරිනි අමරසූරිය,**
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ
වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය.

2025 සැප්තැම්බර් මස 18 වැනි දින,
කොළඹ දී ය.

EOG 09 - 0211

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.